# රස තැන් මතු කරන කිතුල්

කෘෂි ආර්ථිකයේ ගැමි ජීවිත යත් සමඟ සමීප සබඳතාවයක් දක්වන කිතුල් තෙතමනය සහිත කැලෑවල සහ කඳුකර පෙදෙස් වල ස්වාභාවික ලෙසින් වැඩෙන තාල වර්ගයේ ශාකයකි. උද්භිද විද්‍යාඥයින් විසින් "කැරියෝටා යුරේන්ස්" නමින් හඳුන්වනු ලබන කිතුල් ගස අඩි 20-30 ත් අතර උසකින් වැඩෙනු දක්නට ලැබේ. පුෂ්ප මංජරිය නමින් හැඳින්වෙන මල වරින් වර පත්‍ර කක්ෂවල හට ගනී. ලපටි පුෂ්ප මංජරි මැදීමෙන් මීරා ගනු ලැබේ. ශාක ප්‍රචාරණයේ වාහකයක් වන්නේ, උගුඩුවන් වැනි සතුන් සහ වැසි සුළං වැනි ස්වාභාවික මාධ්‍යයන්ය.

## සත්කාරය

උද්භිද විද්‍යාඥයකුගේ ඇසින් ඒ ආකාරයෙන් කිතුල් ගස විවරණය වුවත් පොදු ජන ජීවිතයේ තවත් කප් රුකක් ලෙසින් එය ගැමි ජීවිතයක් සමඟ, පොල් ගස තරම්ම සමීප බැඳීමකින් යුක්ත වෙයි. එයින් ලැබෙන දහසකුත් එකක් එල ප්‍රයෝජනයන් සැලකීමේදී කිතුල් ගස ගැමියාගේ දෛනික ජීවිතයට කොතෙක් දුරට ළංවී ඇත්ද යන්න මනාව ඔප්පු වේ.

ආගන්තුක සත්කාරයෙහිදී කිතුල් හකුරු කෑල්ලක් සමඟ කෝපි කෝප්පයක් පිළිගැන්වීම පුරාණයේ මෙන්ම අදත් ඇතැම් ගැමි ප්‍රදේශයන්හි ගෞරවනීය චාරිත්‍රයක් වෙයි. සිංහලයින්ගේ විවිධ උත්සවයන්හිදී තනනු ලබන රසකැවිලි සඳහා කිතුල් පැණි බෙහෙවින් යොද ගනු ලැබේ. මුදවා ගත් මී කිරි - කිතුල් පැණි සමගින් කෙතරම් ප්‍රණීත වූයේද යත් ගැමි හදවතින් නැගුණු අවංක පැතුම වූයේද කිරිමෙන් පැණියෙන් ඉතිරෙන අනාගතයෙකි.

## ප්‍රස්ථා පිරුලු

ජන කවියාගේ මතකමන් තුල කිතුල් ගස කෙතෙක් දුරට කා වැදී තිබුණේද යත් පංච කල්‍යාණයට එක්වන නාරියකගේ දිගට වැඩුණු කෙස් කළඹ කිතුල් රැනකට උපමා

ජාතික තරුණසේවා සභාවේ

— තරුණසේවා නිලධාරී —

**ආර්. ඒ. ඩබ්. රණසිංහ**

——— විසිනි. ———

කළ බව මහනුවර යුගයෙන් පැහැදිලි වේ. කිතුල් ගහට නැග්ග මිනිහාටත් කීමට යමක් තිබුණු බවට සිංහල ප්‍රස්ථා පිරුලක්ද සඳහන් වේ.

සිංහල ගැමි ජන ජීවිතය වසා වැඩුනු මහා වෘක්ෂයක් වූ කිතුල් ගස ග්‍රාමීය කෘෂි කර්මාන්තයට උරදී ඇති සැටි පැහැදිලි වනුයේ කිතුල් ලී උපයෝගී කොට ගෙන තනා ඇති කෘෂි උපකරණයන් පිළිබඳ සැලකීමෙනි. නගුලක "නගුලීය" හෙවත් "නගුල් ඉහ" නම් වූ කොටස තනා ගනුයේ හෙ ළිඟ් මේර කිතුල් ලීයකිනි. කිතුල් ලී, වෙන් දමූ උදැල්ලත්, උකුණු දුන්නත් අතට ගෙන මහත් උජාරුවෙන් වෙළුව බඟින ගොවියෙකු සෞභාග්‍යයේ සංකේතයක් නොවන්නේද? බොහෝ කල් ගියද නොදිරන නිසාත් ගල් වැල ලිය නොගහන නිසාත් කුඹුරක මායිම් ලකුණු කිරීමේදී කිතුල් කණු සිටවීම අද පවා ගැමි වහරේ දක්නට ලැබේ.

කිතුල් මලින් එල්ලා වැටෙන රැන් අලංකාර සැරසිලි සඳහාත්, වේලා ගැනීමෙන් ලණු වශයෙනුත් භාවිතා කරන අතර ලපටි මල සැඟවී ඇති කොපුව හෙවත් 'හණස්ස' කුඩා වට්ටි සහ පෙට්ටි වියීම සඳහා උපයෝගී කරගනු ලැබේ. හොඳින් මේරූ කිතුල් ලී පරාල වශයෙන් මෙන්ම කවුළුවැට බිත්ති ගොඩ නැංවීමේදී කණු වශයෙන්ද භාවිතා කරනු ලැබේ. ජල පීලි වශයෙන්ද මද ඉවත්කර සකස් කරගත් පසු කිතුල් ලී යොද ගත හැකිවෙයි. කඳේ මතුපිට සහ පොත්ත ඉවත් කොට සූරා ගන්නා හපය සුළු කැපුම් කෙටුම් වලදී යොද ගනු ලබන ප්‍රත්‍යක්ෂ ඖෂධයකි.

ගොඩබිමෙහි ජීවත්වන විශාල තම සතාවූ අලියාගේ පමණක් නොව මිනිසාගේ ප්‍රනීත ආහාරයක් කඳෙහි ලිප්ජාව පටකයෙහි තැන්පත් වී ඇති පිටි වලියෂ සකසා ගත හැකිවේ. පත්‍ර ප්‍රාක්ෂවලින් ලබාගත හැකි කෙඳිවලින් කඹ සහ ලණු ඇඹරීම මෙන්ම බුරුසු, කොසු වැනි විපුල ප්‍රයෝජනවත් දෑ රැසක්ම නිපදවා ගත හැකිවේ. මේ අනුව කිතුල් ගසත් ගැමි ජීවිතයත් එකිනෙකින් වෙන්කළ නොහෙන පරිද්දෙන් කප් කෙළවර ක්දවා පවතිනු ඇත.